" විශිෂ්ට රාජ්‍ය සේවාවක් සඳහා ඇප කැපවෙමු "
# ප්‍රධාන ලේකම් කාර්යාලය - බස්නාහිර පළාත
# பிரதான செயலாளர் அலுவலகம் - மேல் மாகாணம்
# OFFICE OF THE CHIEF SECRETARY - WESTERN PROVINCE
204, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත, බත්තරමුල්ල.
204, டென்சில் கொப்பேகடுவ மாவத்தை, பத்தரமுல்ல.
204, Denzil Kobbekaduwa Mawatha, Battaramulla.

ප්‍රධාන ලේකම් / பிரதான செயலாளர் / Chief Secretary
දුරකථන / தொலைபேசி / Telephone - 011 - 2092599
ෆැක්ස් / பெக்ஸ் / Fax - 011 - 2092601
ඊ-මේල් / மின்னஞ்சல் / E-mail - chiefsecretary@wpc.gov.lk
පොදු දුරකථන / தொலைபேசி இலக்கம் / General Telephone - 011 - 2093000

SLSI ISO 9001 SYSTEM CERTIFIED
SLAB ACCREDITED ISO/IEC: 17021 QMS-001-01

මගේ අංකය / எனது இலக்கம் / My No. CSWP/ADM/30-38/FI/01 ඔබේ අංකය / உமது இலக்கம் / Your No. දිනය / திகதி / Date 2024.10.09

ආණ්ඩුකාර ලේකම්, ආණ්ඩුකාරවර කාර්යාලය (බ.ප)
ලේකම්, පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව (බ.ප.)
සභා ලේකම්, බස්නාහිර පළාතේ පළාත් සභා ලේකම් කාර්යාලය (බ.ප.)
ලේකම්,(පළාත් පාලන/අධ්‍යාපන/කෘෂිකර්ම/ප්‍රවාහන/සෞඛ්‍ය) අමාත්‍යාංශය (බ.ප.)
නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පාලන/පිරිස් හා පුහුණු/මූල්‍ය/සැලසුම්/ඉංජිනේරු)
පළාත් ආදායම් කොමසාරිස් (බ.ප.)
ප්‍රධාන නීති නිලධාරි,නීති ඒකකය (බ.ප.)
අධ්‍යක්ෂ,අභ්‍යන්තර විගණන ඒකකය (බ.ප.)
ප්‍රධාන ලේකම්ගේ සම්බන්ධීකරණ ලේකම්

**<u>මධ්‍යම රජයේ විවිධ අමාත්‍යාංශ වෙතින් ලැබෙන චක්‍රලේඛ (මූල්‍ය චක්‍රලේඛ හැර) බස්නාහිර පළාතට අදාල කර ගැනීමේ කමිටු තීරණ සඳහා අනුමැතිය ලබා ගැනීම.</u>**

උක්ත කරුණට අදාලව පහත සඳහන් චක්‍රලේඛ බස්නාහිර පළාතට අදාල කර ගැනිම සඳහා ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමැතිය ලබා දී ඇති බව ආණ්ඩුකාර ලේකම්ගේ අංක GOS/ADM/6/2/19 හා 2024.10.03 දිනැති ලිපිය මගින් මා වෙත දන්වා ඇත.

| අනු අංකය | දිනය හා චක්‍රලේඛ අංකය | විස්තරය |
|---|---|---|
| 01. | අ.දූ.වෝ.වි.කො.ස. චක්‍රලේඛ 01/2024 හා 2024.03.01 | 2023 අංක 09 දරන දූෂණ විරෝධී පනතේ විධිවිධාන ප්‍රකාරව වත්කම් හා බැරකම් ප්‍රකාශ කිරීම |
| 02. | රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 15/2024 හා 2024.09.06 | අනුමත විදේශ නිවාඩු කාල සීමාවෙන් ඔබ්බට විධිමත් අනුමැතියකින් තොරව විදේශගතව සිටින රජයේ නිලධරයන් සම්බන්ධයෙන් කටයුතු කිරීම. |

02. මෙම චක්‍රලේඛ පිටපත් ඔබගේ විද්‍යුත් තැපැල් ලිපිනයට යොමු කර ඇති අතර, එකී චක්‍රලේඛ පරිදි කටයුතු කරන ලෙස ඔබ යටතේ සිටින සියළුම දෙපාර්තමේන්තු ප්‍රධානීන්, ආයතන ප්‍රධානින් හා නිලධාරීන් දැනුවත් කරන ලෙසත් කාරුණිකව දන්වා සිටිමි.

නදීෂා ඩී. සපරමාදු,
සහකාර ප්‍රධාන ලේකම් (පාලන).
ප්‍රධාන ලේකම් වෙනුවට,
බස්නාහිර පළාත.

දුරකථන අංකය : 011-2092608
ෆැක්ස් අංකය : 011-2092609
විද්‍යුත් ලිපිනය : cswpadm@gmail.com

# බස්නාහිර පළාත් ආණ්ඩුකාරවර කාර්යාලය
## மேல் மாகாண ஆளுநர் பணிமனை
## GOVERNOR'S OFFICE - WESTERN PROVINCE

අංක 204, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත, බත්තරමුල්ල.

இல. 204, டென்சில் கொப்பேகடுவ மாவத்தை, பத்தரமுல்ல.

No. 204, Denzil Kobbekaduwe Mawatha Battaramulla.


ඔබේ අංකය / உமது இல. / Your Ref. } CSWP/ADM/30-38/FI/01

මගේ අංකය / எனது இல. / My Ref. } GOS/ADM/6/2/19

දිනය / திகதி / Date } 2024.10. 03

"ජනතා හිතවාදී විශිෂ්ටතම පළාත් රාජ්‍ය සේවාවක්" -" பொது மக்களுக்கு சிறந்த பொதுச் சேவை " -" People Friendly Excellent Public Service "

07 OCT 2024

ADM-30

ප්‍රධාන ලේකම්,
ප්‍රධාන ලේකම් කාර්යාලය
බස්නාහිර පළාත.

**මධ්‍යම රජයේ විවිධ අමාත්‍යාංශ වෙතින් ලැබෙන චක්‍රලේඛ (මුදල් චක්‍රලේඛ හැර) බස්නාහිර පළාතට අදාල කර ගැනීම සඳහා අනුමැතිය ලබා ගැනීම.**

උක්ත මැයෙන් යුතුව මා අමතන ලද ඔබේ සමාංක හා 2024.09.27 දිනැති ලිපිය හා බැඳේ.

02. ඒ අනුව පහත සඳහන් චක්‍රලේඛයන් පවතින ආකාරයෙන්ම බස්නාහිර පළාත් සභාවට අදාල කර ගැනීම සඳහා ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය ලබා දී ඇති බව කාරුණිකව දන්වමි.

| චක්‍රලේඛ අංකය | චක්‍රලේඛ නිකුත් කළ දිනය | කාරණය |
|---|---|---|
| අ.දූ.වෝ.වි.කො.ස. චක්‍රලේඛ 01/2024 | 2024.03.01 | 2023 අංක 09 දරණ දූෂණ විරෝධී පනතේ විධිවිධාන ප්‍රකාරව වත්කම් හා බැරකම් ප්‍රකාශ කිරීම. |
| රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 15/2024 | 2024.09.06 | අනුමත විදේශ නිවාඩු කාල සීමාවෙන් ඔබ්බට වියිමත් අනුමැතියකින් තොරව විදේශගතව සිටින රජයේ නිලධරයන් සම්බන්ධයෙන් කටයුතු කිරීම. |

**සෝමසිරි පල්ලත්තරගේ**
ආණ්ඩුකාර ලේකම්
බස්නාහිර පළාත

දුරකතන අංක - 0112092816
ෆැක්ස් - 0112092813
විද්‍යුත් තැපැල - governoroffice@secgov.wp.gov.lk


| ආණ්ඩුකාර ලේකම් / ஆளுநரின் செயலாளர் / Secretary to the Governor | සහකාර ලේකම් I / உதவிச் செயலாளர் I / Assistant Secretary I | සහකාර ලේකම් II / உதவிச் செயலாளர் II / Assistant Secretary II | නීති නිලධාරී / சட்ட அதிகாரி / Legal Officer | පරිපාලන නිලධාරී / நிர்வாக அதிகாரி / Administrative Officer | කාර්යාලය / அலுவலகம் / Office |
|---|---|---|---|---|---|
| Tel : 011-2092816 Fax : 011-2092813 e-mail: secretary@secgov.wp.gov.lk | e-mail: ass.secretary1@secgov.wp.gov.lk | e-mail: ass.secretary2@secgov.wp.gov.lk | Tel : 011-2092819 e-mail: legalofficer@secgov.wp.gov.lk | e-mail: ao@secgov.wp.gov.lk | Tel : 011-2093670 Fax : 011-2092771 e-mail: governoroffice@secgov.wp.gov.lk |

අ.දූ.චෝ.වි.කො.ස. චක්‍රලේඛ අංක: 01/ 2024

අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන
කොමිෂන් සභාව
අංක 36,
මලලසේකර මාවත,
කොළඹ 07.
2024.03.01

2023 අංක 9 දරන දූෂණ විරෝධී පනතේ 80 (1) වගන්තිය
යටතේ වත්කම් හා බැරකම් ප්‍රකාශ කිරීමට අදාළ වන
තැනැත්තන් සහ භාරගන්නා ආයතන ප්‍රධානීන් වෙත,

**<u>2023 අංක 9 දරන දූෂණ විරෝධී පනතේ විධිවිධාන ප්‍රකාරව වත්කම් හා බැරකම් ප්‍රකාශ කිරීම</u>**

2023 අංක 9 දරන දූෂණ විරෝධී පනත මඟින් ජාතික රාජ්‍ය සභාවේ 1975 අංක 1 දරන වත්කම් හා බැරකම් ප්‍රකාශ කිරීමේ පනත ඉවත් කර ඇති අතර, දූෂණ විරෝධී පනතේ 79 වගන්තියේ සිට 92 වගන්තිය දක්වා වත්කම් හා බැරකම් ප්‍රකාශ කිරීම සම්බන්ධ විධිවිධාන දක්වා ඇත.

2. ඒ අනුව, මධ්‍යගත ඉලෙක්ට්‍රොනික පද්ධතියක් ස්ථාපිත කර, එමඟින් වත්කම් හා බැරකම් ප්‍රකාශ ලබා ගැනීම හා සත්‍යායනය කිරීමේ වගකීම අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව වෙත පැවරී ඇත.

3. කොමිෂන් සභාව විසින් දැනටමත් ආරම්භ කර ඇති මෙම මධ්‍යගත ඉලෙක්ට්‍රොනික පද්ධතිය ස්ථාපනයට අදාළ මූලික වැඩකටයුතු නිම කර නව ක්‍රමවේදයට අනුව වත්කම් හා බැරකම් ප්‍රකාශ කිරීමේ ක්‍රියාවලියේ කටයුතු ආරම්භ කරන තෙක්, මෙහි ඇමුණුම I හි දක්වා ඇති ආකෘතියට අනුව, මෙතෙක් වත්කම් හා බැරකම් ප්‍රකාශ භාර ගැනීම සහ රඳවා ගැනීම සිදුකළ ආයතන ප්‍රධානීන් යටතේම, අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව වෙනුවෙන්, අදාළ ප්‍රකාශ රඳවා තබාගැනීම හා ඊට අදාළ අනෙකුත් කටයුතු සිදුකරන ලෙස කොමිෂන් සභාව විසින් මෙයින් නියම කරනු ලැබේ.

4. එකී පනතේ 80 (1) වගන්තිය යටතේ දක්වා ඇති වත්කම් හා බැරකම් ප්‍රකාශ සිදු කළ යුතු තැනැත්තන් ඇමුණුම II හි I තීරයේ ද, අදාළ තැනැත්තන් සිය වත්කම් හා බැරකම් ප්‍රකාශ ඉදිරිපත් කළයුත්තේ කාහට ද යන වග ඇමුණුම II හි II තීරයේ ද, ඇතුළත් කර ඇත.

5. වත්කම් හා බැරකම් ප්‍රකාශ භාර ගත යුතු බවට ඇමුණුම II හි II තීරයේ ඇතුළත් කර ඇති තැනැත්තන් මතු සඳහන් කරුණු සම්බන්ධයෙන් සැලකිලිමත් විය යුතුය:—

(i) වත්කම් හා බැරකම් ප්‍රකාශ භාර ගැනීමේ දී, රහස්‍යභාවය ආරක්ෂා වන ආකාරයට භාර ගෙන, සුරක්ෂිතව රඳවා තබා ගැනීම;

(ii) පනතේ 82 වගන්තිය අනුව ඇමුණුම III හි සඳහන් නියමිත කාලය තුළ වත්කම් හා බැරකම් ප්‍රකාශ භාරගැනීම;

(iii) වත්කම් හා බැරකම් ප්‍රකාශ භාර ගත් බවට තහවුරු කිරීම සඳහා සුදුසු ක්‍රමවේදයක් පවත්වාගෙන යාම;

(iv) වත්කම් හා බැරකම් ප්‍රකාශ භාරදීම සම්බන්ධයෙන් යාවත්කාලීන ලේඛනයක් පවත්වාගෙන යා යුතු අතර නියමිත දිනට භාරදුන් සහ නියමිත දිනට භාරනොදුන් අයගේ ලැයිස්තුවක් නියමිත දිනට පසුව, වහාම අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව වෙත ලබා දීමට කටයුතු කිරීම;

(v) වත්කම් හා බැරකම් ප්‍රකාශ ආයතන ප්‍රධානියා වෙත ලබා දීමෙන් අනතුරුව, කොමිෂන් සභාවේ අවසරයකින් තොරව කිසිදු පුද්ගලයෙකුට ප්‍රවේශයක් සඳහා අවස්ථාවක් නොතිබිය යුතු ය;

(vi) කොමිෂන් සභාව විසින් ඉල්ලා සිටිනු ලබන කවර හෝ අවස්ථාවක, වහාම අදාළ වත්කම් හා බැරකම් ප්‍රකාශ/ප්‍රකාශය ප්‍රමාදයකින් තොරව ඉදිරිපත් කිරීම, අදාළ භාරය දරන ආයතන ප්‍රධානියාගේ වගකීමක් විය යුතු ය; සහ

(vii) වත්කම් හා බැරකම් ප්‍රකාශවල ආකෘතිය සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි භාෂාවලින් කොමිෂන් සභාවේ නිල වෙබ් අඩවියෙන්, www.ciaboc.gov.lk බා ගත කරගත හැකි අතර, භාෂා ත්‍රිත්වයෙන් කවර හෝ භාෂාවකින් ඉදිරිපත් කිරීම කළ හැකි ය.

කොමිෂන් සභාවේ අණ පරිදි,



අධ්‍යක්ෂ ජනරාල්
අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව

ඇමුණුම II

| I<br>වත්කම් බැරකම් ප්‍රකාශ ඉදිරිපත් කළයුතු තැනැත්තන් | II<br>වත්කම් බැරකම් ප්‍රකාශ භාරගතයුතු තැනැත්තන් |
|---|---|
| (අ) ජනාධිපතිවරයා | අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව |
| (ආ) අග්‍රාමාත්‍යවරයා, කැබිනට් අමාත්‍යවරු සහ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 45 වන ව්‍යවස්ථාව යටතේ පත් කරනු ලබන අමාත්‍යවරු | ජනාධිපතිවරයා |
| (ඇ) පාර්ලිමේන්තු මන්ත්‍රීවරු | කතානායකවරයා |
| (ඈ) පළාත් ආණ්ඩුකාරවරු | ජනාධිපතිවරයා |
| (ඉ) පළාත් සභා මන්ත්‍රීවරු සහ පළාත් රාජ්‍ය සේවයේ මාණ්ඩලික නිලධරයන් | ආණ්ඩුකාරවරයා (පළාත් සභා මන්ත්‍රීවරුන්ගේ)<br><br>ප්‍රධාන ලේකම් (මාණ්ඩලික නිලධරයන්ගේ)<br><br>පළාත් සභා විෂය භාර අමාත්‍යාංශයේ ලේකම් |
| (ඊ) පළාත් පාලන ආයතනවල තෝරා පත් කර ගනු ලැබූ සභිකයන් සහ මාණ්ඩලික නිලධරයන් | • පලාත් පාලන අමාත්‍යාංශයේ අමාත්‍යවරයා (පළාත් පාලන ආයතන වල සාමාජිකයන්)<br>• පලාත් පාලන අමාත්‍යාංශයේ ලේකම් (නාගරික කොමසාරිස්, පළාත් පාලන ආයතන ලේකම්)<br>• නාගරික කොමසාරිස් (නගර සභා සාමාජිකයන්ගේ, මාණ්ඩලික නිලධරයන්ගේ)<br>• නගර සභා ලේකම් (නගර සභා මාණ්ඩලික නිලධරයන්)<br>• ප්‍රාදේශීය සභා ලේකම් (ප්‍රාදේශීය සභා මාණ්ඩලික නිලධරයන්) |
| (උ) ජනාධිපතිවරයා විසින් පත් කරනු ලබන විනිසුරුවරුන් සහ රජයේ නිලධරයන් | ජනාධිපතිවරයා |

| | |
|---|---|
| (ඍ) අමාත්‍ය මණ්ඩලය විසින් පත් කරනු ලබන රජයේ නිලධරයන් | අදාළ ආයතන ප්‍රධානියා |
| (එ) අධිකරණ සේවා කොමිෂන් සභාව විසින් පත් කරනු ලබන අධිකරණ නිලධරයන් සහ ලේඛනගත රජයේ නිලධරයන් | අධිකරණ සේවා කොමිෂන් සභා ලේකම් |
| (ඒ) අමාත්‍යාංශවල සහ රජයේ දෙපාර්තමේන්තුවල මාණ්ඩලික නිලධරයන් | අදාළ ආයතන ප්‍රධානියා |
| (ඔ) පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් නොවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 41 අ (1) (ඉ) ව්‍යවස්ථාව ප්‍රකාරව පත් කරනු ලබන ලද ව්‍යවස්ථාදායක සභාවේ සාමාජිකයන් | ජනාධිපතිවරයා |
| (ඕ) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 41 ආ ව්‍යවස්ථාවේ උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති කොමිෂන් සභාවල අවස්ථාවෝචිත පරිදි, කොමිෂන් සභාවේ සභාපතිවරුන් හෝ සාමාජිකයන් ලෙස පත් කරනු ලබන තැනැත්තන් | ජනාධිපතිවරයා |
| (ක) ශ්‍රී ලංකා මහ බැංකුවේ සහ රාජ්‍ය බැංකුවල මාණ්ඩලික නිලධරයන් | මහ බැංකු අධිපති (මහ බැංකුවේ මාණ්ඩලික නිලධරයන්ගේ)<br>අදාළ සාමාන්‍යාධිකාරී (බැංකු මාණ්ඩලික නිලධරයන්ගේ) |
| (ග) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 41 අ (1) (ඇ) ව්‍යවස්ථාව යටතේ හෝ යම් ප්‍රඥප්තියක් යටතේ පිහිටුවන ලද ස්වාධීන කොමිෂන් සභාවල මාණ්ඩලික නිලධරයන් | අදාළ ආයතන ප්‍රධානියා |
| (ච) යම් ප්‍රඥප්තියක් මගින් හෝ ඒ යටතේ පිහිටුවන ලද ස්වාධීන නියාමන සහ අධීක්ෂණ කොමිෂන් සභාවල හෝ පුද්ගල මණ්ඩලවල සභාපතිවරු, කොමසාරිස්වරු, සාමාජිකයන් සහ මාණ්ඩලික නිලධරයන් | පත්කිරීම් බලධාරියා / ආයතන ප්‍රධානියා |

| | |
|---|---|
| (ජ) යම් ප්‍රඥප්තියක් මගින් හෝ ඒ යටතේ පිහිටුවන ලද යම් රාජ්‍ය සංස්ථාවක සභාපතිවරු, අධ්‍යක්ෂවරු, මණ්ඩලවල සාමාජිකයන්, විධායක නිලධරයන් | පත්කිරීම් බලධාරියා |
| (ට) පාර්ලිමේන්තුවේ මන්ත්‍රීවරුන්ගේ, පළාත් සභා මන්ත්‍රීවරුන්ගේ සහ පළාත් පාලන ආයතනවල සභිකයන්ගේ පුද්ගලික කාර්ය මණ්ඩල සාමාජිකයන් | පත්කිරීම් බලධාරියා |
| (ඩ) (357 වන අධිකාරය වූ) යුද්ධ හමුදා පනතේ විධිවිධානවලට අනුකූලව ඇති කොට පවත්වාගෙන යන ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ නිලධරයන් | යුද්ධ හමුදාපතිවරයා |
| (ණ) (358 වන අධිකාරය වූ) නාවික හමුදා පනතේ විධිවිධාන වලට අනුකූලව ඇති කොට පවත්වාගෙන යන ශ්‍රී ලංකා නාවික හමුදාවේ නිලධරයන් | නාවික හමුදාපතිවරයා |
| (ත) (359 වන අධිකාරය වූ) ගුවන් හමුදා පනතේ විධිවිධාන වලට අනුකූලව ඇති කොට පවත්වාගෙන යන ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ නිලලත් නිලධරයන් | ගුවන් හමුදාපතිවරයා |
| (ද) 1981 අංක 15 දරන ජනාධිපතිවරයා තෝරාපත්කර ගැනීම පිළිබඳ පනත, 1981 අංක 2 දරන පාර්ලිමේන්තු මැතිවරණ පනත, 1988 අංක 2 දරන පළාත් සභා ඡන්ද විමසීම් පනත, (262 වන අධිකාරය වූ) පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥා පනත හෝ (138 වන අධිකාරය වූ) වෘත්තිය සමිති ආඥා පනතේ කාර්ය සඳහා වන පිළිගත් දේශපාලන පක්ෂවල තනතුරු දරන්නන් | මැතිවරණ කොමසාරිස් |

| | |
|---|---|
| (න) (138 වන අධිකාරිය වූ) වෘත්තීය සමිති ආඥා පනත යටතේ ලියාපදිංචි වී ඇති වෘත්තීය සමිතිවල විධායක නිලධරයන් | කම්කරු විෂයභාර අමාත්‍යාංශයේ ලේකම් |
| (ප) 1981 අංක 15 දරණ ජනාධිපතිවරයා තෝරාපත්කර ගැනීම පිළිබඳ පනත, 1981 අංක 1 දරණ පාර්ලිමේන්තු මැතිවරණ පනත, 1988 අංක 2 දරණ පළාත් සභා ඡන්ද විමසීම් පනත, (262 වන අධිකාරය වූ) පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනත යටතේ පවත්වනු ලබන ඡන්ද විමසීමකදී තෝරා පත්කර ගැනීම සඳහා නම් කළ අපේක්ෂකයන් | මැතිවරණ කොමසාරිස් |
| (බ) රජය හෝ රජයේ සංස්ථාවක් විසින් සියයට විසිපහකට නොඅඩු කොටස් දරන්නා වූ 2007 අංක 07 දරන සමාගම් පනතේ විධිවිධාන යටතේ ලියාපදංචි කළ සමාගම්වල සභාපතිවරුන්, අධ්‍යක්ෂවරු සහ මාණ්ඩලික නිලධරයන් | සමාගම් රෙජිස්ට්‍රාර් |
| (ම) මේ පනතේ අර්ථානුකූලව උපලේඛනගත ආයතන වන්නා වූ මූල්‍ය ආයතනවල කලමනාකරණ හෝ අධීක්ෂණ කටයුතුවල නියැලෙන කාර්ය මණ්ඩලය | අදාළ ආයතන ප්‍රධානියා |
| (ය) ශ්‍රී ලංකාවේ රාජ්‍ය ධූත මණ්ඩලවල ප්‍රධානීන් | ජනාධිපතිවරයා |
| (අඅ) අමාත්‍ය මණ්ඩලය විසින් ශ්‍රී ලංකා රාජ්‍ය ධූත මණ්ඩලවලට පත්කළ නිලධරයන් | විදේශ කටයුතු අමාත්‍යාංශයේ ලේකම් |
| (ආආ) (180 වන අධිකාරය වූ) ප්‍රවෘත්ති පත්‍ර ආඥා පනතේ 2 වන වගන්තිය යටතේ ප්‍රකාශයක් කරනු ලැබ ඇති පුවත්පත්වල හිමිකරුවන්, කර්තෘවරුන් සහ කර්තෘ මණ්ඩලයේ සාමාජිකයන් | ජනමාධ්‍ය කටයුතු අමාත්‍යාංශයේ ලේකම් |
| (ඇඇ)1991 අංක 25 දරණ ශ්‍රී ලංකා විදුලි සංදේශ පනතේ 17 වන වගන්තිය යටතේ බලපත්‍රලාභී මාධ්‍ය සමාගම්වල හිමිකරුවන්, කර්තෘවරුන් සහ කර්තෘ මණ්ඩලයේ සාමාජිකයන් | විදුලි සංදේශ අමාත්‍යාංශයේ ලේකම් |

| | |
|---|---|
| (ඇඇ) ජාතික රාජ්‍ය සභාවේ 1973 අංක 25 දරන ක්‍රීඩා පනත ප්‍රකාරව පිහිටුවනු ලැබූ ජාතික ක්‍රීඩා සම්ගම්වල ධූර දරන නිලධරයන් | ක්‍රීඩා විෂයභාර අමාත්‍යාංශයේ ලේකම් |
| (ඉඉ) යම් නිලධරයන් ඔවුන්ට අදාළ යම් නිලයන්වල කටයුතු කිරීමේදී එම වැඩකටයුතුවල ස්වභාවයන් සැලකිල්ලට ගත්විට අල්ලස් හෝ දූෂණවලට පෙළඹීමට ඒ නිලධරයාට ඇති ඉඩකඩ සැලකිල්ලට ගනිමින් අධිඅවදානම් කාණ්ඩ ලෙස නියෝග මගින් නියම කරනු ලැබිය හැකි පරිදි වූ යම් වෙනත් නිලධාරී කාණ්ඩයන් | අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව විසින් කලින් කලට නියම කරනු ලබන ආකාරයට |

* යම් වෙනත් නීතියක් මගින් විශේෂිත විධි විධාන සලසා ඇති විට එකී විධිවිධාන වලට අනුකූලව වත්කම් බැරකම් ප්‍රකාශ ලබා දීම සිදු කළ යුතු ය.

ඇමුණුම I

# වත්කම් හා බැරකම් ප්‍රකාශය

2023 අංක 9 දරන දූෂණ විරෝධී පනත

1. මුලකුරු සමඟ නම :-

2. ජාතික හැඳුනුම්පත් අංකය:-

3. බදු තොරතුරු අංකය (TIN):-

4. ආයතනය :-

1. සම්පූර්ණ නම : ..............................................................................................

2. කාර්යාලයීය ලිපිනය: ..............................................................................................

3. පෞද්ගලික ලිපිනය : ..............................................................................................

4. තනතුර/රක්ෂාව : ..............................................................................................

5. දෙපාර්තමේන්තුව/ආයතනය/දේශපාලන පක්ෂය : ..............................................................

6. (අ) මාසික වැටුප : ..............................................................................................

(ආ) මාසික දීමනාවල එකතුව : ......................................................................................

7. විවාහක නම් භාර්යාව/ස්වාමිපුරුෂයාගේ නම : ..............................................................

8. භාර්යාව/ස්වාමිපුරුෂයා රක්ෂාවක යෙදී සිටි නම් සේවා ස්ථානයේ නම සහ මාසික වැටුප් } ..............................................................
..............................................................

9. දරුවන් සිටී නම්, ඔවුන්ගේ නම සහ වයස : ..............................................................
..............................................................
..............................................................
..............................................................
..............................................................
..............................................................
..............................................................
..............................................................
..............................................................
..............................................................

‘අ’ කොටස

2023 අංක 9 දරන දූෂණ විරෝධී පනතේ 81 වගන්තිය යටතේ කරනු ලබන ප්‍රකාශයයි.
(සියළුම ප්‍රකාශකයන් විසින් සම්පූර්ණ කළ යුතුය)

1. කිසියම් තැනැත්තෙක් ඔබ, ඔබේ භාර්යාව/ස්වාමිපුරුෂයා හෝ ඔබේ යම් දරුවකු* වෙනුවෙන් කිසියම් දේපළක් භාරයක් වශයෙන් දරයි ද? එසේ නම් එම දේපළෙහි නම, ප්‍රමාණය සහ පිහිටීම ද එය අත්කර ගැනීමේ දිනය ද ඇතුළත් සම්පූර්ණ විස්තර සඳහන් කරන්න.

........................................................................................................................................

........................................................................................................................................

........................................................................................................................................

2. ඔබ, ඔබේ භාර්යාව/ස්වාමිපුරුෂයා හෝ ඔබේ යම් දරුවකු* කිසියම් දේපළක් යම් කෙනෙකු වෙනුවෙන් භාරයක් වශයෙන් දරයි ද? එසේ නම් ඉහත අංක 1හි අසා ඇති අයුරු සම්පූර්ණ විස්තර සපයන්න.

........................................................................................................................................

........................................................................................................................................

........................................................................................................................................

3. ආදායම් බදු ලිපිගොනු අංකය : ..........................................................................................

4. ඔබට, ඔබේ භාර්යාවට/ස්වාමිපුරුෂයාට හෝ ඔබේ යම් දරුවකුට* තැපැල් කාර්යාල ඉතිරි කිරීමේ බැංකුව සහ ජාතික ඉතිරි කිරීමේ බැංකුව ඇතුළු ශ්‍රී ලංකාවේ හෝ විදේශයක යම් බැංකුවල ගිණුම් (ජංගම ගිණුම්, ඉතිරි කිරීමේ ගිණුම්, ස්ථාවර ගිණුම් යනාදිය) කිසිවක් තිබේද? එසේ නම්, පහත සඳහන් විස්තර සපයන්න.

| බැංකුවේ නම සහ ලිපිනය | ගිණුම් හිමියාගේ නම | ගිණුම් අංකය | ගිණුම විවෘත කළ දිනය | නියමිත දිනයේදී පැවති ශේෂය |
|---|---|---|---|---|
| | | | | |
| | | | | |
| | | | | |
| | | | | |
| | | | | |
| | | | | |
| | | | | |

| | | | | |
|---|---|---|---|---|
| | | | | |

5. ඔබ හෝ ඔබේ භාර්යාව/ස්වාමිපුරුෂයා හෝ ඔබේ යම් දරුවකු* ඉතිරි කිරීමේ සහතික පත්‍රවල හෝ අයබදු සහතිකවල හෝ ආණ්ඩුවේ සුරැකුම්පත්වල කිසියම් මුදලක් ආයෝජනය කර තිබේද? එසේ නම්, පහත සඳහන් විස්තර සපයන්න.

| සහතිකය හිමියාගේ නම | සහතික ගණන | නිකුත් කළ දිනය සහ ස්ථානය | ආයෝජිත මුදල |
|---|---|---|---|
| | | | |
| | | | |
| | | | |
| | | | |

6. ඔබ හෝ ඔබේ භාර්යාව/ස්වාමිපුරුෂයා හෝ ඔබේ යම් දරුවකු* පොරොන්දු නෝට්ටු, චෙක්පත් හෝ වෙනත් සුරැකුම් මත හෝ චංචල හෝ නිශ්චල දේපළ උකසට තබාගෙන යම් පුද්ගලයකුට, සමාගමකට හෝ හවුල් ව්‍යාපාරයකට යම් මුදලක් ණයට දී තිබේද? එසේ නම් පහත සඳහන් විස්තර සපයන්න.

| ණය ගැනුම්කරුගේ නම සහ ලිපිනය | ණය මුදල දුන් දිනය සහ ණය මුදලේ ප්‍රමාණය | පොලී ප්‍රමාණය | ඔප්පුවේ අංකය සහ දිනය | නොතාරිස්ගේ නම |
|---|---|---|---|---|
| | | | | |
| | | | | |
| | | | | |
| | | | | |
| | | | | |
| | | | | |

7. ඔබ හෝ ඔබේ භාර්යාව/ස්වාමිපුරුෂයා හෝ ඔබේ යම් දරුවකු* යම් ස්කන්ධ, කොටස් හෝ ඍණ පත්‍ර සතුව සිටීද? එසේ නම්, පහත සඳහන් විස්තර සපයන්න.

| කොටස් හිමියාගේ නම | සමාගමේ නම සහ ලිපිනය | සතු කොටස් ගණන | මිල දී ගත් දිනය |
|---|---|---|---|
| | | | |
| | | | |
| | | | |
| | | | |
| | | | |

8. ඔබ හෝ ඔබේ භාර්යාව/ස්වාමිපුරුෂයා හෝ ඔබේ යම් දරුවකු* යම් ව්‍යාපාරයක යම් මුදලක් ආයෝජනය කර තිබේද? එසේ නම් ආයෝජනය පිළිබඳ සම්පූර්ණ විස්තර සපයන්න.

............................................................................................................................................

............................................................................................................................................

............................................................................................................................................

............................................................................................................................................

............................................................................................................................................

............................................................................................................................................

............................................................................................................................................

............................................................................................................................................

9. ඔබට හෝ ඔබේ භාර්යාවට/ස්වාමිපුරුෂයාට හෝ ඔබේ යම් දරුවකුට* විදේශයක යම් වත්කම් තිබේ ද? එසේ තිබේ නම්, රටේ නම, ඒ වත්කම්වල ස්වභාවය සහ ඒ ආයෝජනය කළ දිනය සඳහන් කරන්න.

............................................................................................................................................

............................................................................................................................................

............................................................................................................................................

............................................................................................................................................

............................................................................................................................................

............................................................................................................................................

............................................................................................................................................

............................................................................................................................................

10. නියමිත දිනයේදී ඔබ වෙත හෝ වෙනත් යම් තැනැත්තෙකුගේ භාරයේ තිබුණු ඔබ සතු මුදල් කවරේදැයි විස්තර කොට මුදලේ ප්‍රමාණය ද ඒ තැනැත්තාගේ නම සහ ලිපිනය ද සඳහන් කරන්න.

............................................................................................................................................

............................................................................................................................................

............................................................................................................................................

............................................................................................................................................

............................................................................................................................................

............................................................................................................................................

............................................................................................................................................

............................................................................................................................................

............................................................................................................................................

11. ඔබට හෝ ඔබේ භාර්යාවට/ස්වාමිපුරුෂයාට හෝ ඔබේ යම් දරුවකුට* යම් බැංකුවක සුරක්ෂිතාගාරයක් තිබේ ද? එසේ නම්, බැංකුවේ නම සහ ලිපිනය ද එම සුරක්ෂිතාගාරය කුලියට ගත් දිනය ද එහි අඩංගු දේවල් ද සඳහන් කරන්න.

.......................................................................................................................................................

.......................................................................................................................................................

.......................................................................................................................................................

.......................................................................................................................................................

.......................................................................................................................................................

.......................................................................................................................................................

.......................................................................................................................................................

12. ආභරණ (කැපූ හෝ නොකැපූ) මැණික් ගල්, රන් හෝ රිදී ඔබට හෝ ඔබේ ස්වාමිපුරුෂයාට/භාර්යාවට හෝ ඔබේ යම් දරුවකුට* අයිතිව, නැතහොත් ඔබ හෝ ඔබේ ස්වාමිපුරුෂයා/භාර්යාව හෝ ඔබේ දරුවන් අතුරින් යම් දරුවකු සන්තකව තිබේ ද? එසේ නම්, ඒ ද්‍රව්‍යවල විස්තරයක් සඳහන් කරන්න.

.......................................................................................................................................................

.......................................................................................................................................................

.......................................................................................................................................................

.......................................................................................................................................................

.......................................................................................................................................................

.......................................................................................................................................................

.......................................................................................................................................................

13. ඔබට හෝ ඔබේ භාර්යාවට/ස්වාමිපුරුෂයාට හෝ ඔබේ යම් දරුවකුට* යම් මෝටර් වාහන, මෝටර් බෝට්ටු හෝ වෙනත් බලවේග වාහන අයිතිව තිබේ ද? එසේ නම්, පහත සඳහන් විස්තර සඳහන් කරන්න.

| වාහනය කුමක්ද යන වග | වර්ගය | ලියාපදිංචි අංකය | මිලට ගත් දිනය |
|---|---|---|---|
| | | | |
| | | | |
| | | | |
| | | | |
| | | | |
| | | | |

14. නියමිත දිනයේ දී ඔබට හෝ ඔබේ භාර්යාවට/ස්වාමිපුරුෂයාට හෝ ඔබේ යම් දරුවකුට* අයිතිව තිබෙන නැතහොත් ඔබ, ඔබේ භාර්යාව/ස්වාමිපුරුෂයා හෝ ඔබේ යම් දරුවකු සන්තකයේ තිබෙන සියලු නිශ්චල දේපළ පිළිබඳ සම්පූර්ණ විස්තර සඳහන් කරන්න.

| ඉඩමේ නම | පිහිටීම | අත්කර ගනු ලැබුවේ කවුරුන් විසින් ද යන වග | අත්කර ගනු ලැබුවේ කවුරුන්ගෙන් ද යන වග | අත්කර ගනු ලැබුවේ කෙසේ ද යන වග (තෑග්ගක්ද මිලට ගැනීමක් ද) | ඔප්පුවේ දිනය සහ අංකය | නොතාරිස්ගේ නම | කෘෂිකාර්මික ඉඩමක් ද නැතහොත් මුඩු ඉඩමක් ද යන වග |
|---|---|---|---|---|---|---|---|
| | | | | | | | |
| | | | | | | | |
| | | | | | | | |
| | | | | | | | |
| | | | | | | | |
| | | | | | | | |
| | | | | | | | |
| | | | | | | | |
| | | | | | | | |
| | | | | | | | |
| | | | | | | | |
| | | | | | | | |

කෘෂිකාර්මික දේපළ සම්බන්ධයෙන් පහත සඳහන් විස්තර සපයන්න.

| ඉඩමේ නම | වවා ඇති භෝගයේ නම (තේ, රබර් ආදී වශයෙන්) | අක්කර ගණන | | | ඔබ විසින් ඉදිකරන ලද ගොඩනැගිලි කවරේ ද යන වග |
|---|---|---|---|---|---|
| | | මේරූ | නොමේරූ | වවා නැති | |
| | | | | | |
| | | | | | |
| | | | | | |
| | | | | | |
| | | | | | |

නිවාස දේපළ සම්බන්ධයෙන් පහත සඳහන් විස්තර සපයන්න.

| ඉඩමේ නම | තක්සේරු අංකය | ලැබෙන කුලිය | | ඉදිකළ දිනය |
|---|---|---|---|---|
| | | | | |
| | | | | |
| | | | | |
| | | | | |
| | | | | |
| | | | | |

15. ඔබ හෝ ඔබේ භාර්යාව/ස්වාමිපුරුෂයා හෝ ඔබේ යම් දරුවකු* කිසියම් මුදලක් ණයට ගෙන තිබේද? එසේ නම්, පහත සඳහන් විස්තර සපයන්න.

| ණයට ගත් මුදල | ණයට ගත් දිනය | ණයට ගන්නා ලද්දේ යම් ආයතනයකින් හෝ යම් තැනැත්තෙකුගෙන් ද ඒ ආයතනයේ හෝ තැනැත්තාගේ නම හා ලිපිනය | තබන ලද ඇපය | ඔප්පුවේ අංකය සහ නොතාරිස්ගේ නම | නියමිත දිනයේදී ණය තිබුණු මුදල |
|---|---|---|---|---|---|
| | | | | | |
| | | | | | |
| | | | | | |
| | | | | | |
| | | | | | |
| | | | | | |

‘ඇ’ කොටස

පළමුවෙන්ම ප්‍රකාශයක් කිරීමට නියමිත වූ දින පැවති වත්කම් හා බැරකම් පිළිබඳ ප්‍රකාශය

(වාර්ෂික ප්‍රකාශය කරන තැනැත්තන් විසින් පමණක් සම්පූර්ණ කළ යුතුය.)

1. කිසියම් තැනැත්තෙක් ඔබ, ඔබේ භාර්යාව/ස්වාමිපුරුෂයා හෝ ඔබේ යම් දරුවකු* වෙනුවෙන් කිසියම් දේපළක් භාරයක් වශයෙන් දැරුවේද? එසේනම් එම දේපළෙහි නම, ප්‍රමාණය සහ පිහිටීම ද එය අත්කර ගැනීමේ දිනය ද ඇතුළත් සම්පූර්ණ විස්තර සඳහන් කරන්න.

.....................................................................................................................................................

.....................................................................................................................................................

.....................................................................................................................................................

2. ඔබ, ඔබේ භාර්යාව/ ස්වාමිපුරුෂයා හෝ ඔබේ යම් දරුවකු* කිසියම් දේපළක් යම් කෙනකු වෙනුවෙන් භාරයක් වශයෙන් දැරුවේද? එසේ නම් ඉහත අංක 1 හි අසා ඇති අයුරු සම්පූර්ණ විස්තර සපයන්න.

.....................................................................................................................................................

.....................................................................................................................................................

.....................................................................................................................................................

3. ආදායම් බදු ලිපිගොනු අංකය .........................................................................................................

4. ඔබට, ඔබේ භාර්යාවට/ස්වාමිපුරුෂයාට හෝ ඔබේ යම් දරුවකුට* තැපැල් කාර්යාල ඉතිරි කිරීමේ බැංකුව සහ ජාතික ඉතිරි කිරීමේ බැංකුව ඇතුළු ශ්‍රී ලංකාවේ හෝ විදේශයක යම් බැංකුවල ගිණුම් (ජංගම ගිණුම්, ඉතිරි කිරීමේ ගිණුම්, ස්ථාවර ගිණුම් යනාදිය) කිසිවක් තිබුණේද? එසේ නම් පහත සඳහන් විස්තර සපයන්න.

| බැංකුවේ නම සහ ලිපිනය | ගිණුම් හිමියාගේ නම | ගිණුම් අංකය | ගිණුම විවෘත කළ දිනය | නියමිත දිනයේදී පැවති ශේෂය |
|---|---|---|---|---|
| | | | | |
| | | | | |
| | | | | |
| | | | | |
| | | | | |
| | | | | |
| | | | | |
| | | | | |
| | | | | |
| | | | | |
| | | | | |

5. ඔබ හෝ ඔබේ භාර්යාව/ස්වාමිපුරුෂයා හෝ ඔබේ යම් දරුවකු* ඉතිරි කිරීමේ සහතික පත්‍රවල හෝ අයබදු සහතිකවල හෝ ආණ්ඩුවේ සුරැකුම්පත්වල කිසියම් මුදලක් ආයෝජනය කර තිබුණේද? එසේ නම්, පහත සඳහන් විස්තර සපයන්න.

| සහතිකය හිමියාගේ නම | සහතික ගණන | නිකුත් කළ දිනය සහ ස්ථානය | ආයෝජිත මුදල |
|---|---|---|---|
| | | | |
| | | | |
| | | | |
| | | | |
| | | | |
| | | | |

6. ඔබ හෝ ඔබේ භාර්යාව/ස්වාමිපුරුෂයා හෝ ඔබේ යම් දරුවකු* පොරොන්දු නෝට්ටු, චෙක්පත් හෝ වෙනත් සුරැකුම් මත හෝ වංචල හෝ නිශ්චල දේපළ උකසට තබාගෙන යම් පුද්ගලයකුට, සමාගමකට හෝ හවුල් ව්‍යාපාරයකට යම් මුදලක් ණයට දී තිබුණේද? එසේ නම්, පහත සඳහන් විස්තර සපයන්න.

| ණය ගැනුම්කරුගේ නම සහ ලිපිනය | ණය මුදල දුන් දිනය සහ ණය මුදලේ ප්‍රමාණය | පොලී ප්‍රමාණය | ඔප්පුවේ අංකය සහ දිනය | නොතාරිස්ගේ නම |
|---|---|---|---|---|
| | | | | |
| | | | | |
| | | | | |
| | | | | |
| | | | | |
| | | | | |

7. ඔබ හෝ ඔබේ භාර්යාව/ස්වාමිපුරුෂයා හෝ ඔබේ යම් දරුවෙකු* යම් ස්කන්ධ, කොටස් හෝ සෘණ පත්‍ර සතුව සිටියේද? එසේ නම්, පහත සඳහන් විස්තර සපයන්න.

| කොටස් හිමියාගේ නම | සමාගමේ නම සහ ලිපිනය | සතු කොටස් ගණන | මිළදී ගත් දිනය |
|---|---|---|---|
| | | | |
| | | | |
| | | | |
| | | | |
| | | | |
| | | | |
| | | | |

8. ඔබ හෝ ඔබේ භාර්යාව/ස්වාමිපුරුෂයා හෝ ඔබේ යම් දරුවකු* යම් ව්‍යාපාරයක යම් මුදලක් ආයෝජනය කර තිබුණේද? එසේ නම් ආයෝජනය පිළිබඳ සම්පූර්ණ විස්තර සපයන්න.

............................................................................................................................................................

............................................................................................................................................................

............................................................................................................................................................

............................................................................................................................................................

............................................................................................................................................................

............................................................................................................................................................

............................................................................................................................................................

............................................................................................................................................................

9. ඔබට හෝ ඔබේ භාර්යාවට/ස්වාමිපුරුෂයාට හෝ ඔබේ යම් දරුවකුට* විදේශයක යම් වත්කම් තිබුණේද? එසේ තිබේ නම්, රටේ නම, ඒ වත්කම්වල ස්වභාවය සහ ඒ ආයෝජනය කළ දිනය සඳහන් කරන්න.

............................................................................................................................................................

............................................................................................................................................................

............................................................................................................................................................

............................................................................................................................................................

............................................................................................................................................................

............................................................................................................................................................

............................................................................................................................................................

............................................................................................................................................................

10. නියමිත දිනයේදී ඔබ වෙත හෝ වෙනත් යම් තැනැත්තකුගේ භාරයේ තිබුණු ඔබ සතු මුදල් කවරේදැයි විස්තර කොට මුදලේ ප්‍රමාණය ද ඒ තැනැත්තාගේ නම සහ ලිපිනය ද සඳහන් කරන්න.

............................................................................................................................................................

............................................................................................................................................................

............................................................................................................................................................

............................................................................................................................................................

............................................................................................................................................................

............................................................................................................................................................

............................................................................................................................................................

............................................................................................................................................................

11. ඔබට හෝ ඔබේ භාර්යාවට/ස්වාමිපුරුෂයාට හෝ ඔබේ යම දරුවකුට* යම බැංකුවක සුරක්ෂිතාගාරයක් තිබුණේ ද? එසේ නම්, බැංකුවේ නම සහ ලිපිනය ද එම සුරක්ෂිතාගාරය කුලියට ගත් දිනය ද එහි අඩංගු දේවල් ද සඳහන් කරන්න.

.............................................................................................................................................

.............................................................................................................................................

.............................................................................................................................................

.............................................................................................................................................

.............................................................................................................................................

.............................................................................................................................................

.............................................................................................................................................

12. ආභරණ (කැපූ හෝ නොකැපූ) මැණික් ගල්, රන් හෝ රිදී ඔබට හෝ ඔබේ ස්වාමිපුරුෂයාට/භාර්යාවට හෝ ඔබේ යම් දරුවකුට* අයිතිව, නැතහොත් ඔබ හෝ ඔබේ ස්වාමිපුරුෂයා/භාර්යාව හෝ ඔබේ දරුවන් අතුරින් යම් දරුවකු සන්තකව තිබුණේ ද? එසේ නම්, ඒ ද්‍රව්‍යවල විස්තරයක් සඳහන් කරන්න.

.............................................................................................................................................

.............................................................................................................................................

.............................................................................................................................................

.............................................................................................................................................

.............................................................................................................................................

.............................................................................................................................................

.............................................................................................................................................

13. ඔබට හෝ ඔබේ භාර්යාවට/ස්වාමිපුරුෂයාට හෝ ඔබේ යම් දරුවකුට* යම් මෝටර් වාහන, මෝටර් බෝට්ටු හෝ වෙනත් බලවේග වාහන අයිතිව තිබුණේ ද? එසේ නම්, පහත සඳහන් විස්තර සඳහන් කරන්න.

| වාහනය කුමක්ද යන වග | වර්ගය | ලියාපදිංචි අංකය | මිලට ගත් දිනය |
|---|---|---|---|
| | | | |
| | | | |
| | | | |
| | | | |
| | | | |
| | | | |

14. නියමිත දිනයේ දී ඔබට හෝ ඔබේ භාර්යාවට/ස්වාමිපුරුෂයාට හෝ ඔබේ යම් දරුවකුට* අයිතිව තිබුණු නැතහොත් ඔබ, ඔබේ භාර්යාව/ස්වාමිපුරුෂයා හෝ ඔබේ යම් දරුවකු සන්තකයේ තිබුණු සියලු නිශ්චල දේපළ පිළිබඳ සම්පූර්ණ විස්තර සඳහන් කරන්න.

| ඉඩමේ නම | පිහිටීම | අත්කර ගනු ලැබුවේ කවුරුන් විසින් ද යන වග | අත්කර ගනු ලැබුවේ කවුරුන්ගෙන් ද යන වග | අත්කර ගනු ලැබුවේ කෙසේ ද යන වග (තෑග්ගක්ද මිලට ගැනීමක් ද) | ඔප්පුවේ දිනය සහ අංකය | නොතාරිස්ගේ නම | කෘෂිකාර්මික ඉඩමක් ද නැතහොත් මුඩු ඉඩමක් ද යන වග |
|---|---|---|---|---|---|---|---|
| | | | | | | | |
| | | | | | | | |
| | | | | | | | |
| | | | | | | | |
| | | | | | | | |
| | | | | | | | |
| | | | | | | | |
| | | | | | | | |
| | | | | | | | |
| | | | | | | | |
| | | | | | | | |
| | | | | | | | |

කෘෂිකාර්මික දේපළ සම්බන්ධයෙන් පහත සඳහන් විස්තර සපයන්න.

| ඉඩමේ නම | වවා ඇති භෝගයේ නම (තේ, රබර් ආදී වශයෙන්) | අක්කර ගණන | | | ඔබ විසින් ඉදිකරන ලද ගොඩනැගිලි කවරේ ද යන වග |
|---|---|---|---|---|---|
| | | මේරූ | නොමේරූ | වවා නැති | |
| | | | | | |
| | | | | | |
| | | | | | |
| | | | | | |
| | | | | | |

නිවාස දේපළ සම්බන්ධයෙන් පහත සඳහන් විස්තර සපයන්න.

| ඉඩමේ නම | තක්සේරු අංකය | ලැබෙන කුලිය | | ඉදිකළ දිනය |
|---|---|---|---|---|
| | | | | |
| | | | | |
| | | | | |
| | | | | |
| | | | | |
| | | | | |

15. ඔබ හෝ ඔබේ භාර්යාව/ස්වාමිපුරුෂයා හෝ ඔබේ යම් දරුවකු* කිසියම් මුදලක් ණයට ගෙන තිබුණේද? එසේ නම්, පහත සඳහන් විස්තර සපයන්න.

| ණයට ගත් මුදල | ණයට ගත් දිනය | ණයට ගන්නා ලද්දේ යම් ආයතනයකින් හෝ යම් තැනැත්තෙකුගෙන් ද ඒ ආයතනයේ හෝ තැනැත්තාගේ නම සහ ලිපිනය | තබන ලද ඇපය | ඔප්පුවේ අංකය සහ නොතාරිස්ගේ නම | නියමිත දිනයේදී ණය තිබුණු මුදල |
|---|---|---|---|---|---|
| | | | | | |
| | | | | | |
| | | | | | |
| | | | | | |
| | | | | | |
| | | | | | |

.................................................................................................................................. වන මම, මා විසින් මෙහි දෙන ලද පිළිතුරු සහ කරන ලද ප්‍රකාශ සත්‍ය හා නිවැරදි බව ගෞරව බහුමානයෙන් අවංකව සහ සත්‍ය ලෙස මෙයින් ප්‍රකාශ කොට ප්‍රතිඥා දෙමි/දිවුරමි.

...............................................

අත්සන

20 ............................... මස ............................ වන දින වූ මෙදින මා ඉදිරියේ දී දිවුරන ලදී/ප්‍රතිඥා දෙන ලදී.

..................................................................

දිවුරුම් කොමසාරිස්/සාම විනිශ්චයකරු

* මෙම පනතේ කාර්යයන් සඳහා -

2023 අංක 9 දරන දූෂණ විරෝධී පනතෙහි 81 වන වගන්තිය යටතේ, මේ කොටස අදාළ වන සෑම තැනැත්තකු ම (මෙහි මින් මතු මේ කොටසේ "වත්කම් සහ බැරකම් ප්‍රකාශය" යනුවෙන් හඳුන්වනු ලබන) 82 වගන්තියේ විධිවිධානවලට අනුකූලව-

(අ) ඔහුගේ සියලු වත්කම් සහ බැරකම්;

(ආ) ඔහුගේ කලත්‍රයාගේ සියලු වත්කම් සහ බැරකම්;

(ඇ) ඔහුගෙන් යැපෙන එක් එක් දරුවන්ගේ වයස නොසලකා එම එක් එක් දරුවන්ගේ සියලු වත්කම් සහ බැරකම්;

(ඈ) ඔවුන්ගේ වයස නොසලකා ඔහුගෙන් යැපෙන වෙනත් තැනැත්තන්ගේ සියලු වත්කම් සහ බැරකම්; සහ

(ඉ) යම් තැනැත්තා මේ කොටස අදාළ වන තැනැත්තා සමඟ අන්‍යෝන්‍ය අයිතිවාසිකම් සහ බැඳීම් හුවමාරු කර නොගන්නා අවස්ථාවකදී හැර, ප්‍රකාශයේ දිනයට අවම වශයෙන් මාස හයකටවත් පෙරාතුව මේ කොටස අදාළ වන තැනැත්තා සමඟ පොදු නිවසක සහවාසයෙන් ජීවත්වන විට දී එකී වෙනත් යම් තැනැත්තාගේ සියලු වත්කම් සහ බැරකම්;

පිළිබඳ ප්‍රකාශයක් සිදු කළ යුතු ය.

පැහැදිලි කිරීමේ සටහන්:

1. නියමිත විස්තර සඳහන් කිරීම සඳහා මේ ආකෘතියේ යම් කිසි තීරයක ඉඩ ප්‍රමාණවත් නොවුවහොත් ඒ විස්තර වෙනම උපලේඛනයක හෝ උපලේඛනවල සැපයිය හැකිය. එහෙත් එසේ අමුණනු ලබන උපලේඛනය ගැන මේ වාර්තාවේ උචිත ස්ථානවල සඳහන් කළ යුතුය. ඒ උපලේඛනයද ඔහු විසින් අත්සන් කරනු ලැබිය යුතුය.
2. මේ ආකෘතියේ යම් කොටස්වල වාර්තා කළයුතු කිසිවක් නැත්නම් ඊට නියි ස්ථානයේ "නැත" යන්න ලියන්න.

ඇමුණුම III

<u>**වත්කම් බැරකම් ප්‍රකාශ ලබා දීමට බැඳී සිටින අවස්ථාවන්**</u>

| | | |
|---|---|---|
| 01. | පළමු පත්වීම ලැබීමෙන් පසු | පත්වීමෙන් මාස 3ක් ඇතුළත |
| 02. | පත්වීමෙන් අනතුරුව | වාර්ෂිකව |
| 03. | විශ්‍රාම යාම හෝ ධූර කාලය අවසානයේ | දින 14 ක් ඇතුළත |
| 04. | විශ්‍රාම යාමෙන් අනතුරුව | වාර්ෂිකව වසර 2ක් |
| 05. | රුපියල් මිලියන දහයට වැඩි වත්කම් ලබා ගැනීමේදී | මාසයක් ඇතුළත |
| 06. | මැතිවරණ අපේක්ෂකයන් | නාම යෝජනා පත්‍ර සමග |

07. ඉහත 01–06 දක්වා ඇතුළත් නොවන පුද්ගලයන් වෙනත් නීති යටතේ වත්කම් බැරකම් ප්‍රකාශ කිරීමට දක්වා ඇති ප්‍රතිපාදනවලට අනුකූලව

**82 වගන්තිය**

*(1) මේ කොටස අදාළ වන සෑම තැනැත්තකු ම නියෝග මගින් කරනු ලැබිය හැකි යම් ආකෘතියකින් වත්කම් සහ බැරකම් ප්‍රකාශය—*

*(අ) (මෙහි මින් මතු "පළමු පත්වීම් ප්‍රකාශය" යනුවෙන් සඳහන් කරනු ලබන) පත් කළ දින සිට මාස තුනක් තුළ;*

*(ආ) (මෙහි මින් මතු "වාර්ෂික ප්‍රකාශය" යනුවෙන් සඳහන් කරනු ලබන) (3) උපවගන්තිය ප්‍රකාරව වාර්ෂිකව;*

*(ඇ) (මෙහි මින් මතු "ධූර කාලය අවසානයේ දී හෝ විශ්‍රාම යාමේ දී සිදු කරනු ලබන ප්‍රකාශය" යනුවෙන් සඳහන් කරනු ලබන) අවස්ථාවෝචිත පරිදි, ඔහුගේ රැකියාවේ නිල කාලය අවසන් වීමේ දී හෝ ඔහුගේ විශ්‍රාම දිනයෙන් හෝ ඔහු ධූරයෙන් ඉවත් කළ දිනයෙන් ඉක්බිතිවම දින දාහතරක් තුළ;*

*(ඈ) (මෙහි මින් මතු "පශ්චාත් විශ්‍රාම ප්‍රකාශය" යනුවෙන් සඳහන් කරනු ලබන) (ඇ) ඡේදය යටතේ ප්‍රකාශය සිදු කළ වර්ෂයට අනුගාමී වර්ෂ දෙකක් තුළ;*

*(ඉ) (මෙහි මින් මතු "තත්කාර්ය ප්‍රකාශය" යනුවෙන් සඳහන් කරනු ලබන) රුපියල් මිලියන දහයක් හෝ රුපියල් මිලියන දහයකට වඩා වැඩි වත්කම් සහ බැරකම් පිළිබඳ වටිනාකමේ සුවිශේෂී වෙනස්කමක් සිදුවන අවස්ථාවක, ඒ සිදුවීමේ දින සිට මාසයක් ඇතුළත; සහ*

(ඊ) අවස්ථාවෝචිත පරිදි, 1981 අංක 15 දරන ජනාධිපතිවරයා තෝරා පත් කර ගැනීම පිළිබඳ පනත, 1981 අංක 1 දරන පාර්ලිමේන්තු මැතිවරණ පනත, 1988 අංක 2 දරන පළාත් සභා ඡන්ද විමසීම් පනත හෝ (262 අධිකාරය වූ) පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනත යටතේ, මැතිවරණ සඳහා නාම යෝජනා පත්‍ර ඉදිරිපත් කර ඇති විට දී, සිදු කළ යුතු ය.

(2) යම් තැනැත්තකු නියම කළ දිනයේ දී මේ කොටස අදාළ නොවන තැනැත්තකු වන අවස්ථාවක දී, මේ කොටස අදාළ වන තැනැත්තකු බවට ඔහු පත්වන දින සිට මාස තුනක් ඇතුළත ඔහු විසින් මේ කොටස අදාළ වන තැනැත්තකු බවට ඔහු පත්වන දිනට ඔහුගේ වත්කම් හා බැරකම් ප්‍රකාශයක් සිදු කළ යුතු ය:

එසේ වුව ද, 80 වගන්තියේ (1) උපවගන්තියේ (ප) ඡේදයේ සඳහන් පරිදි, මෙ කොටස අදාළ වන යම් තැනැත්තකු විසින්, ඡන්ද විමසීම පිළිබඳ දිනය ප්‍රකාශ කරනු ලබන අදාළ නීතිය යටතේ, ප්‍රකාශය සිදු කරනු ලබන දිනය දක්වා වන කාලසීමාව සඳහා ඔහුගේ ප්‍රකාශය ඉදිරිපත් කළ යුතු ය.

(3) (1) වන හෝ (2) වන උපවගන්ති යටතේ වත්කම් සහ බැරකම්වල පළමු ප්‍රකාශය භාරදීමට නියම කර ඇති සෑම තැනැත්තකු ම, මේ කොටස අදාළ වන තැනැත්තකු බවට ඔහු පත්වීම අවසන් වී ඇත්නම් මිස එක් එක් වර්ෂයේ ජූනි මස තිස්වන දින වන විට ඒ වර්ෂයේ මාර්තු මස තිස් එක් වන දිනට ඔහුගේ වත්කම් සහ බැරකම්වල ප්‍රකාශයක් නියෝග මගින් නියම කරනු ලැබිය හැකි ආකෘතියෙන් සිදු කළ යුතු අතර, මේ කොටස යටතේ ඔහුගේ වත්කම් සහ බැරකම්වල ප්‍රකාශයක් සිදු කිරීමට පළමුව ඔහුට නියම කළ දිනයේ ඔහු විසින් දැරූ වත්කම් සහ බැරකම් ඒ ප්‍රකාශයේ ඇතුළත් කළ යුතු ය:

එසේ වුව ද, (2) වන උපවගන්තිය යටතේ වත්කම් සහ බැරකම් ප්‍රකාශයක් සිදු කිරීමට නියම කර ඇති තැනැත්තකු විසින් යම් වර්ෂයක් තුළ මාර්තු මස තිස්එක් වන දිනයට පෙරාතුව මාස හයක් තුළ යම් දිනයක දී පළමු ප්‍රකාශය සිදු කර ඇති අවස්ථාවක දී, (1) වන උපවගන්තියේ (ඉ) ඡේදයේ සඳහන් කරන ලද සුවිශේෂී වෙනසක් ඔහුගේ වත්කම් සහ බැරකම්වල පවතින අවස්ථාවක ඒ සඳහා වන තත්කාර්ය ප්‍රකාශයක් හැර වෙනත් ප්‍රකාශයක් ඒ වර්ෂය සඳහා ඉදිරිපත් කරන ලෙසට ඔහුට නියම නොකළ යුතු ය.